“ඔබේ ඔසප් වාරය ඔබව තිබෙන තාක් කල් (සලාත් හා උපවාසයේ නිරත වීමෙන්) ඔබ වැළකී සිටිනු. පසුව ස්නානය කරනු

දේව විශ්වාසීන්ගේ මෑණියක් වූ ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් මෙසේ වාර්තා කරන ලදී. සැබැවින්ම අබ්දුර් රහ්මාන් ඉබ්නු අව්ෆ් තුමා යටතේ සිටි, උම්මු හබීබා
බින්ත් ජහ්ෂ් තුමිය අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත රුධිර වහනය වීම පිළිබඳ පැමිණිළි කළාය. පසුව එතුමාණෝ ඇයට: “ඔබේ ඔසප් වාරය ඔබව
තිබෙන තාක් කල් (සලාත් හා උපවාසයේ නිරත වීමෙන්) ඔබ වැළකී සිටිනු. පසුව ස්නානය කරනු.” යැයි පැවසූහ. පසුව ඇය සෑම සලාතයක දීම සෝද ගන්නට පුරුදු වී සිටියාය.
[صحيح] [رواه مسلم]

අඛණ්ඩව රුධිරය වහනය වීම ගැන සහාබිවරියක් විසින් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් වෙත පැමිණිලි කළාය. එවිට, මෙම හදිසි අවස්ථාව ඇය වෙත පැමිණීමට පෙර ඇගේ ඔසප් කාලය ඇයව රඳවාගෙන සිටිය තාක් කල් ඇය සලාත් ඉටු නොකළ යුතු බවත් පසුව ඇය ස්නානය කර සලාතය ඉටු කළ යුතු බවත් ඇයට නියෝග කර සිටියහ. පසුව ඇය සෑම සලාතයක් සඳහාම සෝදා ගත්තාය.

http://sunnah.global/hadeeth/si/show/10015